**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**
**ශාස්ත්‍රවේදී ප්‍රථම වසර පරීක්ෂණය**
**දෙවන සෙමෙස්තරය - 2019/2020**

# SLG 1202 - සාහිත්‍ය ප්‍රවේශය

(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

01. යථාර්ථවාදී සාහිත්‍ය කලාව විෂයෙහි අවබෝධය නූතන සාහිත්‍ය සම්භාෂණය වෙත සමීප වූ අන්දම හා ඊට පුරෝගාමී වූ පුද්ගලයන්ගේ කාර්යභාරය ගැන විවරණයක් සපයන්න.

02. සාහිත්‍ය රස විඳීම සහ සාහිත්‍ය අධ්‍යයනය එකිනෙකට සම්බන්ධ හා එකිනෙකට වෙනස් කටයුතු දෙකක් වන්නේය. මේ කියමන විග්‍රහ කරන්න.

03. මතු දැක්වෙන අදහස් දෙක ඔබ කැමති විදේශීය කෙටිකතා කීපයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

- උසස් සාහිත්‍ය කෘතියක් කාලයේ වැලිතලාවට යටව නොයයි
- උසස් සාහිත්‍ය කෘතියකින් මානව ජීවිතය විෂයෙහි පාඨකයාගේ ජීවිතාවබෝධය පුළුල් කරයි.

04. මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත

- සුභාෂිතය-

ඈත කාලයක දී ප්‍රකාශිත මේ සුභාෂිතය මනුෂ්‍ය සම්බන්ධතා අවබෝධ කර ගැනීමට ඉවහල් වන විචාර චින්තාවකි. මේ අදහස සිංහල කෙටිකතා කීපයක් ආශ්‍රයෙන් විභාග කරන්න.

05. නූතන සිංහල කවියෙහි අභිවෘද්ධියට දායක වූ ප්‍රධාන කවීන්ගේ දායකත්වය පෙන්වා දෙමින්, කවිය නම් වූ සාහිත්‍යාංගය පාඨකයාගේ භාවමය ජීවිතය පෝෂණය කිරීම උදෙසා පශ්චාත් කාලීන කවීන් භාවිත කර ඇති අන්දම නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

06. යථාර්ථවාදී නවකතාව පාඨකයාගේ ජීවන මං හසර පුළුල් කිරීමට සමත් ප්‍රබලතම සාහිත්‍යාංගය වේ. මේ අදහස ඔබ කැමති නවකතා කීපයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**********************